# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,717 - 2011 ජූලි මස 29 වැනි සිකුරාදා - 2011.07.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 308 |


සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 අගෝස්තු මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජූලි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# විවිධ දැන්වීම්

**1942 අංක 59 දරන ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

(වෛද්‍ය) ජයලත් ජයවර්ධන වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 48(1) දරන ස්ථාවර නියෝගය යටතේ "1942 අංක 59 දරන ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ සංගමයේ නම "ශ්‍රී ලංකාවේ දයාවේ සොහොයුරන්ගේ සංගමය" යනුවෙන් සංශෝධනය කිරීම සහ ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන සහ 2 වන වගන්ති සංශෝධනය කිරීමයි.

දොස්තර ජයලත් ජයවර්ධන,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
ගම්පහ දිස්ත්‍රික්කය.

07-750

---

**කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද වාණිජ මහාධිකරණයේ දී ය**

වෙහිකල් ලවර්ස් ප්‍රයිවට් ලිමිටඩ්,
අංක 310ඒ, හයිලෙවල් පාර,
කොළඹ 06.

නඩු අංකය : 23/2011/CO

2007 අංක 7 දරන සමාගම් පනතේ 12 වැනි කොටස යටතේ වෙහිකල් ලවර්ස් ප්‍රයිවට් ලිමිටඩ් විසුරුවා හැර ඇවර කිරීම සඳහා කරනු ලබන ඉල්ලීමයි.

ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානය,
අංක 310, හයිලෙවල් පාර,
කොළඹ 06
*පෙත්සම්කරු*

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොළඹ දී පැවැත්වෙනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් වෙහිකල් ලවර්ස් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම ඇවර කිරීම සඳහා කොළඹ 06, හයිලෙවල් පාරේ අංක 310 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා ක්‍රිෂ්ණ මූර්ති මධ්‍යස්ථානය විසින් එකී අධිකරණය වෙත නීතිඥ සරත් පී. වල්ගමගේ මහතා මගින් 2011 මැයි මස 03 වැනි දින පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ බවත්, එකී පෙත්සම 2011 සැප්තැම්බර් මස 06 වැනි දින අධිකරණය හමුවේ විමසීමට නියම කරනු ලැබූ බවත්, එකී පෙත්සම පිළිබඳ නියෝගයක් ලබා දීමට පක්ෂව හෝ විපක්ෂව කරුණු ඉදිරිපත් කිරීමට කැමැත්තක් දක්වන එකී සමාගමේ කවර හෝ ණයහිමියන් හෝ සහ දායකයන් වෙත්නම් එම අරමුණ වෙනුවෙන් එකී විමසීම කරනු ලබන අවස්ථාවේදී පෞද්ගලිකව හෝ සිය නීතිඥවරයා මගින් පැමිණ සිටිය හැකි බවත්, පෙත්සමේ පිටපතක් එකී සමාගමේ ඕනෑම ණයහිමියෙකුට හෝ සහ දායකයෙකුට නියමිත ගාස්තු ගෙවීම මත පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන බව ගත හැකි බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන් කළේ
නීතිඥ සරත් පී. වල්ගමගේ මහතා,
අංක 37, පන්සල පාර, කොළඹ 10.

*සටහන : එකී පෙත්සම විමසීමට ගන්නා අවස්ථාවේ පෙනී සිටීමට අපේක්ෂා කරන කවර හෝ පුද්ගලයෙකු ඒ පිළිබඳ ලිඛිත දැන්වීමක් පෙත්සම්කරුගේ ලියාපදිංචි නීතිඥ සරත් පී. වල්ගමගේ මහතා වෙත ගෙනවිත් භාරදීම හෝ තැපැල් මගින් එවීම කළ යුතුය. එහි අදාල පුද්ගලයාගේ නම සහ ලිපිනයද, ආයතනයක් නම් එහි නම සහ ලිපිනය ද සඳහන් කොට පුද්ගලයා හෝ ආයතනය හෝ නීතිඥවරුන් (ඇත්නම්) විසින් අත්සන් තබා ගෙනවිත් භාරදීම හෝ තැපැල් මගින් එවන්නේ නම් ප්‍රමාණවත් පරිදි කල්වේලා ඇතිව ඉහත නම් සඳහන් අය වෙත ලැබෙන සේ 2011 සැප්තැම්බර් මස 05 දින සවස 6.00ට පෙර එවිය යුතුය.*

07-713

**ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රිනී ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝග යටතේ ද "ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස්" එක සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී "ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස්" එක සංස්ථාගත කිරීමයි.

1. ලෝකය පුරා විසිර සිටින හැකියාව ඇති ජනතාවට ගණකාධිකරණයෙහි න්‍යාය හා භාවිත යන සෑම අංශයකින්ම පෙරට ගොස් ඔවුන්ගේ වෘත්තිය පුරාම සාමාජිකයින්ට ආධාර කොට මහජන උනන්දුව වර්ධනය කළ හැකි අධිවෘත්තික සංවිධානයක් ලබා දීම;

2. ව්‍යවහාරික විද්‍යා, කලා, වෙළඳාම් හා වෘත්තීන්, රාජ්‍ය හා මහජන සේවා පරිපාලනය, කර්මාන්ත හා වාණිජ සේවා ආශ්‍රයෙන් මහජන යහපත උදෙසා ගණකාධිකරණය ප්‍රවර්ධනය කර ඒ මගින් මහජන අධ්‍යාපනය උසස් කිරීම;

3. ජීවිතය පුරා ගණකාධිකාරින්ගේ උන්නතියට ආධාර දෙමින් ගණකාධිකරණයෙහි කාර්ය සාධන ප්‍රමිතීන් උසස් කොට ගණකාධිකාරීන්ට පෞද්ගලිකව පුහුණුව ලබා දෙමින් දියුණුවට අවස්ථා සැලැස්වීම

යනාදිය වේ.

ගරු ශ්‍රියානි විජේවික්‍රම,
පාර්ලිමේන්තු මන්ත්‍රිනී,
දිගාමඩුල්ල දිස්ත්‍රික්කය.

07-628

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.